සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

2025 - 01

Learning Resource Center
R
De Mazenod College
Kandana
53461

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name .................................................. විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

01. ගෙවත්ත සඳහා බෝග තෝරා ගැනීමේ දී,
   1. කෙටිකාලීන බෝග පමණක් තෝරා ගත යුතු ය.
   2. බහුවාර්ෂික බෝග පමණක් තෝරා ගත යුතු ය.
   3. දේශීය බෝග ප්‍රභේද පමණක් තෝරා ගත යුතු ය.
   4. සමතුලිත පරිසර පද්ධතියක් ලෙස විවිධ බෝග තෝරා ගත යුතු ය.

02. දුර්වල ජලවහනය සහිත ස්ථානයක් සිටුවීමට වඩාත් සුදුසු බෝග දෙකක් වන්නේ,
   1. බණ්ඩක්කා හා මිරිස් ය.  2. කංකුං හා කොහිල ය.
   3. තක්කාලි හා සේර ය.  4. වැටකොළු හා පතෝල ය.

03. පාසල් ගෙවත්ත සැලසුම් කිරීමේ දී ජල සැපයුම ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට සුදුසු විසඳුමක් වන්නේ,
   1. අවට ඇති ගාකවල අතු කප්පාදු කිරීම ය.
   2. බහුවාර්ෂික බෝග වර්ග පමණක් වගා කිරීම ය.
   3. නියං ප්‍රතිරෝධ බෝග තෝරා ගැනීම හා බිංදු ජලසම්පාදන ක්‍රම යෙදීම ය.
   4. සමෝච්ච ක්‍රමයට බෝග වගා කිරීම ය.

04. නිවසේ එකතු වන අපද්‍රව්‍ය කළමනාකරණයට වඩාත් සුදුසු ක්‍රමයක් වන්නේ,
   1. අපද්‍රව්‍ය පුළුස්සා දැමීම ය.
   2. කුණු වළකට එකතු කිරීම ය.
   3. දිරාපත්වන අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ය.
   4. අපද්‍රව්‍ය වෙන් කර නගර සභාවට ලබා දීම ය.

05. ජල සම්පත පිළිබඳව පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. පෘතුවි තලයෙන් 97% පමණ මිරිදියෙන් යට වී ඇත.
   2. පොළව මතුපිට පවතින මිරිදිය ජල ප්‍රභව නිල්දිය සම්පත් නම් වේ.
   3. භුගත ජලය වාෂ්පිකරණය වීමෙන් වලාකුළු නිර්මාණය වේ.
   4. පෘතුවිතලයේ ඇති ජලයෙන් මිනිස් පරිභෝජනයට සුදුසු වන්නේ 3%කි.

06. ගංමෝය හා ඩෙල්ටා ආශ්‍රිතව පවතින විශේෂ පරිසර පද්ධතිය හඳුන්වනුයේ,
   1. කඩොලාන පරිසර පද්ධතිය ලෙසිනි.  2. ශුෂ්ක රූප පරිසර පද්ධතිය ලෙසිනි.
   3. සදාහරිත වනාන්තර පරිසර පද්ධතිය ලෙසිනි.  4. ජලජ පරිසර පද්ධතිය ලෙසිනි.

07. ගංවතුර පාලනයට වැදගත්ව වන වගුරු ආශ්‍රිත ශාක හා සත්ව විශේෂවලින් පොහොසත් කිවුල් දිය වගුරු බිමක් වන්නේ,
   1. බෙල්ලන්විල අත්තිඩිය වගුරු බිම ය.  2. මුතුරාජවෙල වගුරු බිම ය.
   3. මන්නාරම් කලපුව ආශ්‍රිත වගුරු බිම ය.  4. බුන්දල වගුරු බිම ය.

08. විසිතුරු භාණ්ඩ හා හස්ත කර්මාන්ත සඳහා යොදා ගනු ලබන ජල ප්‍රභව ආශ්‍රිතව දක්නට ලැබෙන ශාක කිහිපයක් වන්නේ,
   1. වෙල් ආතා හා කෙකටිය ය.  2. කිරල හා ජපන් ජබර ය.
   3. ගල්ලැහැ හා තුන්හිරිය ය.  4. නෙළුම් හා තීරමුල්ලිය ය.

09. ජලජ පරිසර ආශ්‍රිතව වැවෙන ආක්‍රමණශීලී වල් පැලෑටි දෙකක් වන්නේ,
1. නිදිකුම්බා හා පන්වර්ග ය.
2. කලාඳුරු හා නීරමුල්ලිය ය.
3. බිම්තඹුරු හා කෙකටි ය.
4. සැල්වීනියා හා ජපන් ජබර ය.

10. ඇපල් හා කෙසෙල් වැනි පලතුරු කැපූ විගස කහට පිපීම සිදුවන්නේ,
1. බැක්ටීරියා ක්‍රියාකාරීත්වය නිසාය.
2. දිලීර ක්‍රියාකාරීත්වය නිසා ය.
3. එන්සයිම ක්‍රියාකාරීත්වය නිසාය.
4. මේරීමට පෙර අස්වනු නෙලීම නිසා ය.

11. එළවළුවල නැවුම් ස්වභාවය ආරක්ෂා වන පරිදි කල්තබා ගැනීමේ ක්‍රමයක් වන්නේ,
1. ශීතනය ය.
2. අධිශීතනය ය.
3. ලුණුවල ගිල්වා තැබීම ය.
4. කාමර උෂ්ණත්වයේ ගබඩා කිරීම ය.

12. ක්ෂුද්‍රජීවී පැසවීම මගින් කල්තබා ගැනීමට සකස් කළ ආහාර වර්ග දෙකක් වන්නේ,
1. යෝගට් හා මුදවපු කිරිය.
2. ලුණු දෙහි හා අච්චාරුය.
3. කෝඩියල් හා අයිස් ක්‍රීම්ය.
4. කල්කිරි හා ජීවානුහරිත කිරි පැකට් ය.

13. පා පැදියක ඇති කොටස්වලින් චලනය නොවන කොටසක් වන්නේ,
1. පාදිකය ය.
2. දැතිරෝද ය.
3. දම් වැල ය.
4. පා පැදි අසුන ය.

14. උපකරණ හා යන්ත්‍රවල චලනය වන ස්ථානවලට ලිහිසි ද්‍රව්‍ය යොදන ලබන්නේ,
1. වේගය වැඩි කිරීම සඳහා ය.
2. කම්පන අඩු කිරීම සඳහා ය.
3. ඝර්ෂණය නිසා සිදුවන රත්වීම හා ගෙවීම පාලනය සඳහා ය.
4. චලනය වන දිශාව වෙනස් කිරීම සඳහා ය.

15. විද්‍යුත් පරිපථ එකලස් කිරීමේ දී පෑස්සීම් සඳහා පාස්සන ඊයම් භාවිතා කරනුයේ,
1. විද්‍යුතය ගමන් නොකරන නිසා ය.
2. එහි යකඩ ද අඩංගු නිසා ය.
3. පෑස්සීම පහසු හා ඉක්මන් කිරීමට ය.
4. හොඳින් බැඳීම මළ නොබැඳීම නිසා ය.

16. විදුලි පරිපථයකට යොදනු ලබන ධාරිත්‍රකයක (Capacitor) කාර්යය වන්නේ,
1. පරිපථය හරහා ධාරාව සැපයීම වැළැක්වීම ය.
2. විද්‍යුත් සංඥා, ආලෝක සංඥා බවට පත් කිරීම ය.
3. ආරෝපණ තාවකාලිකව ගබඩා කර ගැනීම ය.
4. පරිපථය තුළ ගලන ධාරාව අඩු කිරීම ය.

17. වෙළඳපොලක් ලෙස හඳුන්වනුයේ,
1. ගැණුම්කරුවන් හා තැරැව්කරුවන් හමුවන ස්ථානයයි.
2. විවිධ මට්ටටම් අතර මැදි අලෙවිකරුවන් හමුවන ස්ථානයයි.
3. අලෙවිකරුවන් හා වෙන්දේසිකරුවන් හමුවන ස්ථානයයි.
4. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් හමුවන ස්ථානයයි.

18. යම් කිසි භාණ්ඩයක තිබිය යුතු ගුණාත්මක බව පවතින බවට තහවුරු කරමින් ශ්‍රී ලංකාව තුළ දී ලබා දෙන ප්‍රමිති සහතිකය වන්නේ,
1. SLS ය.
2. SPC ය.
3. ISO ය.
4. IMF ය.

19. ව්‍යාපාරයක් සතු සමාජ වගකීම වන්නේ,
1. ප්‍රජා සංවර්ධනයට දායක වීම ය.
2. පරිසර හිතකාමී ලෙස ව්‍යාපාර පවත්වා ගෙන යාම ය.
3. පාරිභෝගික යහපත කෙරෙහි සැලකිලිමත් වීම ය.
4. ඉහත කරුණු සියල්ලම ය.

20. පැළ තවානක් ආරම්භ කළ කුඩා පරිමාණ ව්‍යාපාරිකයකුට තම නිෂ්පාදන පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට වඩාත් සුදුසු ප්‍රචාරක මාධ්‍ය වන්නේ,
1. මුද්‍රිත පුවත්පත් දැන්වීම ය.
2. අත්පත්‍රිකා දැන්වීම ය.
3. රූපවාහිනී දැන්වීම් ය.
4. ගුවන් විදුලි දැන්වීම් ය.

## II කොටස

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01. i) ගෙවත්තේ පාංශු ඛාදනය වළක්වා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග දෙකක් යෝජනා කරන්න.

ii) පාසල්වල ගෙවතු වගා ආරම්භ කිරීමේදී ඇති වන ඉඩකඩ සීමිත වීමේ ගැටළුවට සුදුසු විසඳුම් දෙකක් සඳහන් කරන්න.

iii) ගෙවත්තේ පලිබෝධ පාලනයට සුදුසු පරිසර හිතකාමී ක්‍රම හතරක් සඳහන් කරන්න.

iv) දුර්වල ජලවහනයක් පවතින භූමියක එම තත්ත්වය වෙනස් කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් ලියන්න.

02. i) ගෙවතු ආශ්‍රිතව ගොවිපළ සතුන් ඇති කිරීමේ ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

ii) ගොවිපළ සතුන් ලෙස කුකුලන් ඇති කිරීමේ ප්‍රධාන ක්‍රම තුනක් ලියන්න.

iii) ගොවිපල අපද්‍රව්‍ය නිසා පරිසරයට සිදුවන අහිතකර බලපෑම් හතරක් දක්වන්න.

iv) කිරි අමුද්‍රව්‍ය ලෙස යොදා ගෙන කළ හැකි විවිධ නිෂ්පාදන හතරක් ලියන්න.

03. i) නරක් වූ ආහාරයක් පහසුවෙන් හඳුනා ගත හැකි ලක්ෂණ හතරක් ලියන්න.

ii) ආහාර නරක් වීම බලපාන ප්‍රධාන සාධක තුනක් නම් කරන්න.

iii) ආහාර නරක්නොවී කල්තබා ගත හැකි තාක්ෂණික ක්‍රම හතරක් ලියන්න.

iv) ආහාර නිෂ්පාදනයක සෞඛ්‍ය ආරක්ෂිත බව පවත්වා ගැනීමට හේතුවන කරුණු දෙකක් ලියන්න.

04. i) පහත සඳහන් අස්වනු වර්ග නෙලීමට සුදුසු තත්වයේ පවතීද යන්න තීරණය කරන සාධකය බැගින් ලියන්න.

1. බණ්ඩක්කා -
2. කෙසෙල් -
3. පැපොල් -
4. තක්කාලි -

ii) අස්වනු නෙලීමේ දී හා හැසිරීමේ දී හානි සිදුවීමට බලපාන ක්‍රියාකාරකම් හතරක් සඳහන් කරන්න.

iii) අඹ වැනි පලතුරුවල අස්වනුවලට හානි නොවන පරිදි නෙලා ගත හැකි උපකරණයක රූප සටහනක් ඇඳ දක්වන්න.

iv) ප්‍රවාහනයේදී අස්වනුවලට සිදුවන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

05. i) සීමිත භූමි ඉඩකඩ කළමනාකරණයට උපකාරීවන අයුරින් නව නිර්මාණ සැදීමේ දී ඒ සඳහා සුදුසු වන උපක්‍රම දෙකක් ලියන්න.

ii) පළතුරු ආශ්‍රිතව ආරම්භ කළ හැකි ව්‍යාපාරික අවස්ථා තුනක් ඉදිරිපත් කරන්න.

iii) වෙළඳපොළ විමර්ශනයක දී සොයා බලන කරුණු දෙකක් ලියන්න.

iv) අලෙවි ප්‍රවර්ධනයේදී වැදගත් වන මූලිකාංග දෙකක් නම් කරන්න.